# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,937 - 2015 ඔක්තෝබර් මස 16 වැනි සිකුරාදා - 2015.10.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 672 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 675 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 676 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 නොවැම්බර් මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ඔක්තෝබර් මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

671 – B 080992 —402 (2015/10)

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2015 අංක 367

MOD/DEF/03/02/PRO/RNF/01/06.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2014 අප්‍රේල් මස 14 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් හව්පේ ලියනගේ චාමර, එන්ආර්එක්ස් 2314, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

10 - 510/3

---

2015 අංක 368

MOD/DEF/03/02/PRO/RNF/01/06.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද
නිලයේ ස්ථිර කිරීම්

*2014 නොවැම්බර් මස 30 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (මාලිමා) වශයෙන් :*

*ලුතිනන් (මාලිමා) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (මාලිමා)] කොඩිකාර මුහන්දිරම්ගේ දොන් ඔස්කා සුරංග කොඩිකාර., එන්ආර්එක්ස් 1898, ශ්‍රීලංනාහ*

*2014 දෙසැම්බර් මස 26 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ) වශයෙන් :*

*ලුතිනන් (නාසෙ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ)] අමරසිංහ ආරච්චිලාගේ දුලන මේඝවර්ණ ආරියදාස අමරසිංහ, එන්ආර්පී 1695, ශ්‍රීලංනාහ*

*2015 ජනවාරි මස 11 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (ඒඑස්ඩබ්) වශයෙන් :*

*ලුතිනන් (ඒඑස්ඩබ්) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඒඑස්ඩබ්)] විතානගේ ඉන්දික සමන්සිරි පෙරේරා, එන්ආර්එක්ස් 2226, ශ්‍රීලංනාහ*

*2015 පෙබරවාරි මස 26 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (සංඥා) වශයෙන් :*

*ලුතිනන් (සංඥා) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සංඥා)] සුද්දහේවගේ දුලිප් සුරංග ප්‍රනාන්දු, එන්ආර්එක්ස් 1771, ශ්‍රීලංනාහ*

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 සැප්තැම්බර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

10 - 510/5

---

2015 අංක 369

MOD/DEF/03/02/PRO/RNF/01/06.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද
නිලයේ ස්ථිර කිරීම්

*2014 දෙසැම්බර් මස 21 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්] පිලිප් මාක් රත්නායක එන්ආර්එක්ස් 2204, ශ්‍රීලංනාහ

*2015 ජුනි මස 26 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (තොතා) වශයෙන් :*

ලුතිනන් (තොතා) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (තොතා)], තරංග ලක්මාල් මහවත්ත, එන්ආර්ටී 2470, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජුලි මස 30 වැනි දින,
කොළඹ දී ය.

10 - 510/4

2015 අංක 370

MOD/DEF/03/02/PRO/RNF/01/06.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2015 මාර්තු මස 26 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) ගීගන ගමගේ දොන් නිසල ඉසුරු මුණසිංහ, එන්ආර්ඊ 2333, ශ්‍රීලංනාහ

*2015 ජුනි මස 20 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වියාබ) වශයෙන් :*

ලුතිනන් (වියාබ) වර්ණසූරිය මුදියන්සේලාගේ ලලිත් කරුණාරත්න, එන්ආර්ඉසෙඩ් 2262, ශ්‍රීලංනාහ

*2015 ජුනි මස 27 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ) වශයෙන් :*

ලුතිනන් (නාසෙ) කෝදාගොඩ හිටිගේ හිරාන් එන්දික කෝදාගොඩ, එන්ආර්පී 1896, ශ්‍රීලංනාහ

*2015 ජුනි මස 27 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (කිමි) වශයෙන් :*

ලුතිනන් (කිමි) හල්විටිගල ගමගේ චතුරංග විමර්ශණ පියසේන, එන්ආර්එක්ස් 2239, ශ්‍රීලංනාහ

*2015 ජුනි මස 27 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් සුනෙත් දර්ශණ වීරසිංහ, එන්ආර්එක්ස් 2246, ශ්‍රීලංනාහ

*2015 ජුනි මස 27 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වියාබ) වශයෙන් :*

ලුතිනන් (වියාබ) රන්කොත් ගෙදර තුසිත සංජීව කරුණාරත්න, එන්ආර්ඉසෙඩ් 2278, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,<br>ලේකම්,<br>ආරක්ෂක අමාත්‍යාංශය.

2015 අගෝස්තු මස 25 වැනි දින,<br>කොළඹ දී ය.

10 - 510/2

---

2015 අංක 371

MOD/DEF/03/02/PRO/RNF/01/06.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2015 ජුනි මස 06 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ) වශයෙන් :*

ලුතිනන් (නාසෙ) මේස්ත්‍රිගේ තිලිණ චාමර යෝගානන්ද ද සිල්වා, එන්ආර්පී 1895, ශ්‍රීලංනාහ

*2015 ජුනි මස 06 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් යාපා මුදියන්සේලාගේ සිරිමෙවන් යාපා වීරතුංග, එන්ආර්එක්ස් 2255, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,<br>ලේකම්,<br>ආරක්ෂක අමාත්‍යාංශය.

2015 අගෝස්තු මස 25 වැනි දින,<br>කොළඹ දී ය.

10 - 510/1

---

2015 අංක 372

MOD/DEF/03/02/PRO/RNF/01/06.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2015 ජුනි මස 20 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් විජේමුනිගේ සාගර සුදත් ගුණතිලක, එන්ආර්එක්ස් 2240, ශ්‍රීලංනාහ

*2015 අගෝස්තු මස 01 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (කිමි) වශයෙන් :*

ලුතිනන් (කිමි) කරුණා ජේඩිගේ ධනංජය විපුලසේන, එන්ආර්එක්ස් 2257, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,<br>ලේකම්,<br>ආරක්ෂක අමාත්‍යාංශය.

2015 සැප්තැම්බර් මස 07 වැනි දින,<br>කොළඹ දී ය.

10 - 510/6

2015 අංක 373

MOD/DEF/03/02/PRO/RNF/01/06.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2015 ජූලි මස 11 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් මායාගොඩගේ දිනූෂ චින්තක පෙරේරා, එන්ආර්එක්ස් 2252, ශ්‍රීලංනාහ
ලුතිනන් හේරත් මුදියන්සේලාගේ අජන්ත සරත් බණ්ඩාර හේරත්, එන්ආර්එක්ස් 2258, ශ්‍රීලංනාහ

*2015 ජූලි මස 11 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන් :*

ලුතිනන් (සැ) පාරමී සම්පත් සේරසිංහ, එන්ආර්එස් 2267, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

10 - 510/8

---

2015 අංක 374

MOD/DEF/03/02/PRO/RNF/01/06.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2015 ජූලි මස 15 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) සෙම්බ කුට්ටි අරුණ නිශාන්ත, එන්ආර්ඊ 2283, ශ්‍රීලංනාහ

*2015 ජූලි මස 15 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (පනිසෞ) වශයෙන් :*

ලුතිනන් (පනිසෞ) හැගොඩ ගමගේ ටෝනි ප්‍රියංකර, එන්ආර්ඩබ් 2284, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

10 - 510/9

---

2015 අංක 375

MOD/DEF/03/02/PRO/RNF/01/06.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2015 ජූලි මස 06 වැනි දින සිට වෛද්‍ය ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

වෛද්‍ය ලුතිනන් තෙන්නකෝන් මුදියන්සේලාගේ ඉන්දික ඥාණකීර්ති බණ්ඩාර, එන්ආර්එම් 2408, ශ්‍රීලංනාහ
වෛද්‍ය ලුතිනන් යෙළරුවන් කුමාර අමරසිංහ, එන්ආර්එම් 2409, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

10 - 510/7

---

2015 අංක 376

MOD/DEF/03/02/VNF/ COM.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද
අධිකාරියට පත් කිරීම

*2015 ජනවාරි මස 16 වැනි දින සිට විධායක අංශයේ වැඩ බලන උප ලුතිනන් (ස්වේච්ඡා) වශයෙන් :*

සචින්තනා ලොකුවත්තගේ, එන්වීඑක්ස් 5822, ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බීඑම්යූඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

10 - 509

# රජයේ නිවේදන

**2015 වාර්ෂික තොග ගණන් ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයීම් අංශයේ සියළුම බෙහෙත් ගබඩා වසා තැබීම**

වර්ෂ 2015 දෙසැම්බර් මස 01 වැනි දින සිට 2015 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා, (දෙදිනම ඇතුළුව) තොග ගණන් බැලීම සඳහා රජයේ වෛද්‍ය සැපයීම් අංශයේ සියලුම ගබඩාවන් වසා තබනු ඇත.

අත්‍යාවශ්‍ය හදිසි වෛද්‍ය සැපයීම් සහ අන්තරාදායක ඖෂධ හැර වෙනත් කිසිම තොග නිකුත් කිරීමක් සඳහා එම කාල පරිච්ඡේදය තුළ දී අයදුම්පත් භාර නොගන්නා බව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්. මහ රෝහල් අධ්‍යක්ෂවරුන්, සෞඛ්‍ය අමාත්‍යාංශ යටතට ගැනෙන අනෙකුත් සෞඛ්‍ය ආයතනවල අධ්‍යක්ෂවරුන්, ආරක්ෂක අංශවල කාර්යභාර වෛද්‍ය නිලධාරීන් (ගුවන්, නාවික, පාබල සහ පොලීසිය), විශේෂිත ව්‍යාපෘති භාර ප්‍රධානීන් හා බෙහෙත් ශාලා භාර නිලධාරීන් වෙත මෙයින් කාරුණිකව දැනුම් දෙමි.

වෛද්‍ය ලාල් පනාපිටිය,
අධ්‍යක්ෂ,
වෛද්‍ය සැපයීම් අංශය.

2015 සැප්තැම්බර් මස 22 වැනි දින,
අංක 357,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

10 - 533

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධි විධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *අංකය* | *ලියාපදිංචි කිරීමේ දිනය* | *විස්තරය* | *පිහිටීම* | *දේවගැතිතැන අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද* |
|---|---|---|---|---|---|
| 1458 | 2015.07.13 | එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් දේවස්ථානය | අංක 35/1, නාරන්දණ්ඩ, පටුමග, වත්තේගම | ගරු එච්. එච්. සුනිල් ශාන්ත පියතුමා | එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන් (1974 අංක 53 දරන පාර්ලිමේන්තු පනතේ සංස්ථාපිත) ක්‍රිස්තියානි |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 සැප්තැම්බර් මස 28 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

10 - 717/1

### ගොඩනැගිල්ල ලියාපදිංචි කිරීමේ සහතිකය

සහතික අංකය : 1458

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තිය යටතේ කරන ලද ඉල්ලීම ප්‍රකාශය අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත විස්තර කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව සහතික කරමි.

| විස්තර | පිහිටීම | | දිස්ත්‍රික්කය | දේවගැති තැන අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියා පදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද |
|---|---|---|---|---|---|
| | ගම හෝ වීථිය සහ නගර කොට්ඨාසය | පත්තුව, කෝරළය හෝ දිස්ත්‍රික්කයේ වෙනත් කොට්ඨාසය | | | |
| එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් දේවස්ථානය වත්තේගම | අංක 35/1, නාරන්දණ්ඩ පටුමග, වත්තේගම | පාතදුම්බර ප්‍රාදේශීය ලේකම්, කොට්ඨාසය | මහනුවර | ගරු එච්. එච්. සුනිල් ශාන්ත පියතුමා | එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන් (1974 අංක 53 දරන පාර්ලිමේන්තු පනතේ ස්ථාපිත) ක්‍රිස්තියානි |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

වර්ෂ 2015ක් වූ සැප්තැම්බර් මස 28 වැනි දින,
බත්තරමුල්ලේ දී මගේ අත්සන තබන ලදී.

10 - 717/2

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

එස් - 11234.

### සමිති ආඥාපනත (123 අධිකාරය)

6 (1) වගන්තිය යටතේ "සීමාසහිත ස්වාධීන මල් වවන්නන්ගේ හා අලෙවි කරන්නන්ගේ සමිතිය" හි නම කපා හැරීමේ දැන්වීම.

සමිති ආඥාපනත (123 අධිකාරය) විධිවිධාන යටතේ 2011.12.14 වැනි දින ලියාපදිංචි සමිතියක් වන "සීමාසහිත ස්වාධීන මල් වවන්නන්ගේ හා අලෙවි කරන්නන්ගේ සමිතිය" ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතු පැවති හෙයින්, 2015.02.13 වැනි දින "සීමාසහිත ස්වාධීන මල් වවන්නන්ගේ හා අලෙවි කරන්නන්ගේ සමිතිය" නම මෙම කාර්යාලයේ තිබෙන සමිති රෙජිස්ටරයෙන් කපා හැරි බවත්, සමිතිය විසුරුවා හැරි බවත්, සමිති රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම සමිති ආඥාපනතේ 6 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2015 සැප්තැම්බර් මස 18 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 534

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිගමනය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 1813864.
යසන්ත සුරංග පතිරත්න.

2015 අගොස්තු මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් වී. පී. ඩයස් විසින් 2013 ජනවාරි මස 9 වැනි දින සහතික කරන ලද අංක 2164 සහ 2014 නොවැම්බර් මස 3 වැනි දින සහතික කරන ලද අංක 2688 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි නමට ලියන ලද්දාවූ ද, බැඳුම්කර යටතේ (මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම) අයවිය යුතු මුදල් ගෙවීම යසන්ත සුරංග පතිරත්න ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද,

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. පී. හේරත් විසින් 2013 අගෝස්තු මස 21 වැනි දින සහතික කරන ලද අංක 2101 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, බැඳුම්කරය (මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම යසන්ත සුරංග පතිරත්න ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද,

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් වී. පී. ඩයස් විසින් 2014 ජුනි මස 25 වැනි දින සහතික කරන ලද අංක 2578 දරන කොමර්ෂන් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය (මෙහි 3 වැනි

උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම යසන්ත සුරංග පතිරත්න ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද,

එකී බැඳුම්කර යටතේ රුපියල් එක්කෝටි අනූහය ලක්ෂ අනූපන්දහස් දෙයිය තුනක (රු. 1,96,95,203) මුදලක් 2015 ජූලි මස 22 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රුපියල් එක්කෝටි අනූහය ලක්ෂ අනූපන්දහස් දෙසිය තුනක (රු. 1,96,95,203) මුදල අයකර ගැනීම සඳහා සහ 2015 ජූලි මස 23 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 1,83,90,000ක මුදල මත 13%ක වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 2164, 2688, 2101 සහ 2578 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද, දේපළ හා පරිශ්‍ර කොළඹ 12, හල්ෆ්ඩ්‍රොප් වීදියේ අංක 200හි 2 වන මහලේ ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාතලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි අධ්‍යක්ෂක මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, අළුත්කුරු කෝරළේ දූනගහපත්තුවේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාවේ 86A, කැලෑපිටිමුල්ල ග්‍රාම නිලධාරී වසවේ කැලෑපිටිමුල්ල ගමේ පිහිටි කහටගහවත්ත බෙදාවෙන්කොට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. විතාරකන විසින් 2001 දෙසැම්බර් මස 15 වැනි දින සාදන පිඹුරු අංක 4109හි ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මහා මාර්ගය ද, නැගෙනහිරට : වික්‍රමපාලට අයිති ඉඩම සහ ලොට් 5 සහ 6 ද, දකුණට : ලොට් 2 ද සහ බස්නාහිරට : ඇල මාර්ගය වන මෙය විශාලත්වයෙන් රූඩ් එකයි පර්චස් තිස් දෙකයි දශම එකයි එකක් (අ. 0, රූ. 1, පර්. 32.11) වන මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව E 1008/154 යටතේ ලියාපදිංචි වී ඇත.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ දූනගහපත්තුවේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාවේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 86A, කැලෑපිටිමුල්ල ග්‍රාම නිලධාරී වසවේ ඌරපන ගමේ පිහිටි රන්ඩිච්ලන්ඩ් වත්ත එහි ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියළු දේ සමග බෙදාවෙන්කොට බලයලත් මිනින්දෝරු ජී. කේ. එන්. තිලකසිරි විසින් 2012 ජනවාරි මස 18 වැනි දින සාදන ලද T/1245 දරන පිඹුරේ ලොට් A වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට (මෙය බලයලත් විනින්දෝරු ටී. සී. එස්. ප්‍රනාන්දු විසින් 1982.12.14 වැනි දින සාදන ලද පිඹුරු අංක 200/72හි දැක්වෙන ලොට් 110 සහ 111 හි එකතුවක් හා නැවත මැනීමක් වේ) මායිම් වශයෙන්, උතුරට : පිඹුරු අංක 200/72 හි ලොට් 112 ද, නැගෙනහිරට : (P.S.) පාර සහ පිඹුරු අංක 200/72 හි ලොට් 35 ද, දකුණට : පිඹුරු අංක 200/72 හි ලොට් 109 ද, සහ බස්නාහිරට : පිඹුරු අංක 200/72හි ලොට් 137, 136 සහ 135 සහ මතු සඳහන් පිඹුරු අංක T 1245 ට අනුව විශාලත්වයෙන් රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) වන මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව E 1154/03 යටතේ ලියාපදිංචි වී ඇත.

### තුන්වන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ, අළුත්කුරු කෝරළේ දූනගහපත්තුවේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාවේ 86, ඌරපන ග්‍රාම නිලධාරී වසමේ ඌරපන් කැලෑපිටිමුල්ල සහ මාපලන්ගෙදර ගම්වල පිහිටි විනිෆ්‍රඩ් වත්ත බෙදාවෙන්කොට බලයලත් මිනින්දෝරු එස්. සෙනරත් විසින් 2008 මැයි මස 05 වැනි දින සාදන අංක 3200 දරන පිඹුරේ ලොට් 8 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් 7 ද, නැගෙනහිරට : ලොට් 9 ද, දකුණට : ඩී. තිවංක ප්‍රේමරත්නට අයිති එම ඉඩමේම ඉතිරි කොටස සහ බස්නාහිරට : ලොට් 12, විශාලත්වයෙන් පර්චස් පහලොවයි දශම හතරයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 15.42) එහි ඇති ගොඩනැගිල්ල, ගහකොළ සහ අනෙකුත් සියලු දේ සමග වන මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 1075/128 යටතේ ලියාපදිංචි වී ඇත.

මතු සඳහන් පිඹුරු අංක 3200හි දැක්වෙන ලොට් 9 (අඩි 20ක් පළල පාර) හි පරිහරණය සඳහා ඇති අයිතිය සමග වෙ.

රන්ජනී ගමගේ මිය,
සමාගම් ලේකම්.

10 - 617

---

### ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2015 අගෝස්තු මස 26 වැනි දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව නමට කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන ප්‍රසිද්ධ නොතාරිස් ටී. එස්. අයි. වැත්තෑව ලියා සහතික කරන ලද අංක 3622 හා 2006 අගෝස්තු මස 01 වැනි දින දරන උකස් බැඳුම්කරය ද, ප්‍රසිද්ධ නොතාරිස් පිලීෂියන් පෙරේරා ලියා සහතික කළ අංක 3518 හා 2002 අගෝස්තු මස 24 වැනි දින දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් වඳුරාගල ලියා සහතික කළ අංක 19200 හ 2014 මාර්තු මස 31 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම්, "මහින්ද මෙටල් ප්‍රඩක්ට්ස්" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ ගිරිඋල්ලේ ව්‍යාපාරය කරගෙන යන කුරුණෑගල, ගිරිඋල්ලේ රණසිංහ ආරච්චිගේ ප්‍රියන්ත අනුරුද්ධ රණසිංහ යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2015 ජූලි මස 31 වැනි දිනට ඉහත කී රණසිංහ ආරච්චිගේ ප්‍රියන්ත අනුරුද්ධ රණසිංහ යන අයගෙන් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුවට රුපියල් අනූහතර ලක්ෂ හතළිස් නව දහස් තුන්සිය අසූහතකුත් ශත හතරක (රු. 94,49,387.04) මුදලක් සහ 2015 අගෝස්තු මස 01 වැනි දින පටන් විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් විසිදෙලක්ෂ අටදහස් තුන්සිය තිස් හතක (රු. 22,08,337) මුදලක් සඳහා මාසිකව ඒ ඒ මාසයේ ව්‍යාපාර කටයුතු කරනු ලබන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහා බැංකුව විසිත් සතිපතා පදනම මත පළකරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.පී.ආර්.) වර්ෂයකට සියයට අටක් (8%) ඉහළ අනුපාතිකය මත ගණනය කරනු ලබන වාර්ෂික අනුපාතිකය මත පොළිය සහ රුපියල් හැටදෙලක්ෂ හැත්තෑ දෙදහස් හත්සිය විස්සක (රු. 62,72,720) මුදලක් සඳහා සෑම මාසයකම ඒ ඒ මාසයේ ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිශෝධනය කර සතිපතා පදනම මත පළකරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළි අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.පී.ආර්.) වර්ෂයකට සියයට හතකුත් දශම පහක් (7.5%) ඉහළ අනුපාතිකයක් මත ගණනය කරනු ලබන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් අනූහතර ලක්ෂ හතළිස් නව දහස් තුන්සිය අසූහතකුත් ශත හතරක (රු. 94,49,387.04) මුදලක් සහ 2015 අගෝස්තු මස 01 වැනි දින පටන් විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් විසිදෙලක්ෂ අටදහස් තුන්සිය තිස් හතක (රු. 22,08,337) මුදලක් සඳහා මාසිකව ඒ ඒ මාසයේ ව්‍යාපාරික කටයුතු කරනු ලබන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහා බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.පී.ආර්.) වර්ෂයකට සියයට අටක් (8%) ඉහළ අනුපාතිකය මත ගණනය කරන පොළිය සහ රුපියල් හැටදෙලක්ෂ හැත්තෑ දෙදහස් හත්සිය විස්සක (රු. 62,72,720) මුදලක් සඳහා සෑම මාසයකම ඒ ඒ මාසයේ ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිශෝධනය කර සතිපතා පදනම මත පළකරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.පී.ආර්.) වර්ෂයකට සියයට හතකුත් දශම පහක් (7.5%) ඉහළ අනුපාතිකයක් මත ගණනය කරනු ලබන වාර්ෂික අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම, හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 3622, 3518 සහ 19200 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහසංශෝධිත පරිදි වූ 1995 අංක 35 දනර ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩී.එෆ්.සී.සී. බැන්ක් පී.එල්.සී. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 3622, 3518 සහ 19200 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොළ හත්පත්තුවේ, නැගෙනහිර මැදපත්තු කෝරළේ, එළිබිච්චිය ග්‍රාමයේ පිහිටි " කහටගහමුලවත්ත" නොහොත් "කිතුල්කැලේ" යනුවෙන් හැඳින්වෙන ඉඩමේ, බලයලත් මානක එම්. ගුණසේකර මැන සකස්කළ අංක 91/86 හා 1986.10.18 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 ලකුණු කළ බෙදා වෙන්කළ ඉඩමට මායිම්, උතුරට : ගම්සභා පාර කලින් බී. එම්. පීටර් සිංඤෝට අයිතිව තිබුණු දැනට බී. එම්. ගුණරත් බණ්ඩාට සහ තවත් අයට අයිති ඉඩම ද, නැගෙනහිරට : කලින් බී. එම්. පීටර් සිංඤෝට අයිතිව තිබුණු දැනට බී. එම්. ගුණරත් බණ්ඩාර සහ තවත් අයට අයිති ඉඩම කලින් ඩී. සී. ජයකොඩිට අයිතිව තිබුණු දැනට ඒ. එස්. අදිකාරිට අයිති ඉඩම, කලින් බී. එම්. අප්පුහාමිට අයිතිව තිබුණු දැනට එස්. බී. බී. දිසානායකට අයිති ඉඩම ද, දකුණට: කලින් බී. එම්. අප්පුහාමිට අයිතිව දැනට එස්. බී. බී. දිසානායකට අයිති ඉඩම සහ කලින් පී. තිසරන්හාමිට අයිති තිබුණු දැනට ඩී. එම්. මුතුමැණිකේට අයිති ඉඩම සහ කරත්ත පාර ද, බස්නාහිරට : කරත්ත පාර සහ ගම්සභා පාරද යන මායිම් ඇතුළත අක්කර නවයකුත් රූඩ් දෙකකුත් පර්චස් 20 (අ. 9, රූ. 2, පර්. 20) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි වැවිලි හා වෙනත් සියලු දේ. මෙම ඉඩම කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

මෑතකදී කළ මැනීමකට අනුව මෙම ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත.

ඉහත කී කුරුණෑකල දිස්ත්‍රික්කයේ, කටුගම්පොළ හත්පත්තුවේ, නැගෙනහිර මැදපළාත කෝරළේ. පන්නල ප්‍රාදේශීය සභා සීමාව තුළ පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය බලප්‍රදේශය ඇතුළත අංක 1578 එළිබිච්චිය ග්‍රාම සේවක වසමේ. එළිබිච්චිය ග්‍රාමයේ පිහිටි "කහටගහමුලවත්ත" නොහොත් "කිතුල්කැලේ" යනුවෙන් හැඳින්වෙන ඉඩමේ, බලයලත් මානක ආර්. බී. මොරගනේ මැන සකස් කළ අංක 1694 හා 2007.12.04 දින දරන පිඹුරේ ලොට් අංක 1 ලකුණු කළ බෙදා වෙන්කළ ඉඩමට මායිම්, උතුරට සහ උතුරු නැගෙනහිරට : බී. එම්. ගුණරත්බණ්ඩාගේ ඉඩම සහ බී. එම්. මුතුමැණිකේගේ ඉඩම ද, නැගෙනහිරට සහ දකුණු-නැගෙනහිරට : ඒ. එම්. එම්. අදිකාරිගේ ඉඩම සහ බී. එම්. දිසානායකගේ සහ බී. එම්. මුතුමැණිකේගේ ඉඩම ද, දකුණු සහ දකුණු-බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාර සහ මුතුමැණිකේ ඉඩම ද, උතුරු-බස්නාහිරට : කොටදෙණියාව-බෝපිටිය පාර ද යන මායිම් ඇතුළත අක්කර නවයකුත් රූඩ් දෙකකුත් පර්චස් දහනවයක් (අ. 09 රූ. 2. පර්. 19) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. ආර්. ප්‍රනාන්දු,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 02.

10 - 655

---

**ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2015 අගෝස්තු මස 03 වැනි දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව නමට ප්‍රසිද්ධ නොතරිස් ජේ. එම්. යූ. කේ. ජයවර්ධන විසින් ලියා සහතික කරන ලද අංක 133 සහ 134 හා 2009 ජූලි මස 27 වැනි දින දරන උකස් බැඳුම්කර දෙක මත සහ අංක 228 සහ 229 හා 2010 ජූලි මස 16 වැනි දින දරන උකස් බැඳුම්කර දෙක මත අයවිය යුතු මුදල් ගෙවීම්, සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර ඇත්තාවූ ද, ලියා පදිංචි අංක PV 63525 දරන හා ලියාපදිංචි කාර්යාලය හොරණ පිහිටා ඇත්තා වූ ද සමාගමක් වන, (මෙහි මින් ඉදිරියට "එකී සමාගම" යනුවෙන් සඳහන් කරන) "රිච්වේ ලෑන්ඩ්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්" සමාගම විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2015 ජුනි මස 30 වැනි දිනට ඉහත කී අංක 133, 134, 228 හා 229 දරන උකස් බැඳුම්කර මත, එකී රිච්වේ ලෑන්ඩ්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්" සමාගමෙන් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවට රුපියල් තිස්නව ලක්ෂ හැත්තෑතුන් දහස් හත්සිය පණස්පහකුත් ශත අසූපහක (රු. 39,73,755.85) මුදලක් සහ 2015 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ

දිනය දක්වා එයින් රුපියල් විසිහත් ලක්ෂ අනූහතර දහස් තුන්සිය තුනකුත් ශත විසිහතක (රු. 27,94,303.27) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රියෙල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරනු ලබන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.පී.ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත පොළිය ද සහ රුපියල් හත් ලක්ෂ පනස් දහස් හත්සිය දහනවයකුත් ශත තිස්නවයක (රු. 7,50,719.39) මුදලක් සහ ඒ සඳහා වර්ෂයකට සියයට පහළොව (15%) බැගින් ගණනය කළ පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් තිස්නව ලක්ෂ හැත්තෑතුන් දහස් හත්සිය පනස්පහකුත් ශත අසූපහක (රු. 39,73,755.85) මුදලක් සහ 2015 ජූලි මස 01 වැනි දින පටන් විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් විසිහත් ලක්ෂ අනූහතර දහස් තුන්සිය තුනකුත් ශත විසිහතක (රු. 27,94,303.27) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රියෙල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරනු ලබන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.පී.ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත පොළිය ද, සහ රුපියල් හත් ලක්ෂ පනස් දහස් හත්සිය දහනවයකුත් ශත තිස්නවයක (රු. 7,50,719.39) මුදලක් සහ ඒ සඳහා වර්ෂයකට සියයට පහළොව (15%) බැගින් ගණනය කළ පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම, ගොඩනැගිලි හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 133, 134, 228 හා 229 දරන උකස් බැඳුම්කර මගින් හොරණ රිච්වේ ලෑන්ඩ්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම විසින් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම, ගොඩනැගිලි හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 133 සහ 228 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර රයිගම් කෝරළේ, කුඹුකේපත්තුවේ, වෑවල පිහිටි "අළුබෝගහවත්තකැලේ" නමැති ඉඩමේ බලයලත් මානක ඩී. එච්. ඇතුළත්මුදලි විසින් මැන සකස්කළ අංක 3833 හා 2003.03.01 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 26 ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ලොට් අංක 48 ද, නැගෙනහිරට : ලොට් අංක 48 සහ ලොට් අංක 40 ද, දකුණට : ලොට් අංක 40, 39, 38, 37, 4, 36 ද, බස්නාහිරට : ලොට් අංක 53 සහ ලොට් අංක 48 ද යන මායිම් ඇතුළත ඉහත කී 3833 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකකුත් පර්චස් තිස්පහයි දශම එකක් (අ. 0, රූ. 1, පර්. 35.1) හෙවත් හෙක්ටයාර 0.1900 බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ.

මෙයට මෙහි පහත විස්තර කරන බිම් කොටස් තුළින්, මතින් සහ ඔස්සේ මාර්ග අයිතිය සහ ඊට අයිති වෙනත් පොදු අයිතිවාසිකම් ද ඇතුළත් වේ.

මෙයට, මෙහි පහත විශේෂයෙන් විස්තර කරන මාර්ගයෙන් හෝ එය ඔස්සේ හෝ එය මතින් උකස්කරුට ද ඔහුගේ ආගන්තුකයන්ට, ඉංජිනේරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, ගෘහනිර්මාණ ශිල්පීන්ට, කම්කරුවන්ට, සේවකයන්ට, කුලී නිවැසියන්ට, අවසරලාභීන්ට සහ ආරාධිතයින්ට ද පයින් හෝ අන්‍යාකාරයකින් සදාකල් දිවා හෝ රාත්‍රී කාලයේ ඔවුනගේ කැමැත්ත හා මනාපය පරිදි කවර වූ හෝ කාර්ය සඳහා යාම් ඊම් කිරීමට ද අශ්වයින්, ගවයින් හෝ වෙනත් සතුන් සහිතව හෝ නොමැතිව ද මෝටර් කාර්, මෝටර් ලොරි හෝ වෙනත් ඕනෑම වර්ගයකම හෝ විස්තරයකට අයත් වාහනවලින් බරපටවා හෝ නොපටවා ප්‍රවේශවීමේ හා පිටවීමේ සහ ප්‍රත්‍යාගමනය කිරීමේ අයිතිවාසිකම ද ඒ සමග සාමාන්‍යයෙන් දරන්නා වූ ප්‍රයෝජන ගන්නා වූ හා බුක්ති විඳින්නා වූ හිමි සියලු හා එක් එක් අයිතිවාසිකම්, ප්‍රතිලාභ හා අනුබන්ධනද ඒ බිම මතින්, තුළින් හරහා සහ/හෝ ඔස්සේ විදුලි රැහැන් සහ මුදුන් කම්බි හා ජලාපවහන, ගෑස් හා ජලනල එළීමේ හෝ වෙනත් උචාරණ හෝ උපක්‍රම යෙදීමේ පූර්ණ හා බාධා විරහිත අයිතිවාසිකම, නිදහස හා අවසරය ඇතුළත් වේ.

1. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර රයිගම් කෝරළේ, කුඹුකේපත්තුවේ, වෑවල පිහිටි "අළුබෝගහවත්තකැලේ" නමැති ඉඩමේ බලයලත් මානක ඩී. එච්. ඇතුළත්මුදලි විසින් මැන සකස් කරන ලද අංක 3833 හා 2003.03.01 දින දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කළ බිම් කට්ටිය ලොට් අංක 48 ලකුණු කළ (මීටර 9ක් පළල පාර)ට මායිම්, උතුරට : උපාලි ගුණසේකර හිමිකම් කියන අංක 253 පිඹුරේ ලොට් A ද, නැගෙනහිරට : ලොට් අංක 8, 9, 19, 47, 24 සහ 25 ද, දකුණට : පාර සහ ලොට් අංක 26 සහ 53 ද, බස්නාහිරට : ලොට් අංක 7 සහ 49 ද යන මායිම් ඇතුළත ඉහත කී 3833 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකකුත් පර්චස් දොළහයි දශම තුනක් (අ. 0, රූ. 1, පර්. 12.3) හෝ හෙක්ටයාර 0.1323 බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කොටස සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

